**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.466,706 ක් වූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම් සකස් කළ පසු ආදායම ලද බව ප්‍රකාශ කරමි. |

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම්<br>අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ලැබිය යුතු ශේෂය රු.85,750 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ශේෂය රු.1,907,737 ක් විය. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දි අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ගෙවිය යුතු ගිණුම්<br>අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ශේෂය රු.1,907,737 ක්ව පැවතුණි. | ගෙවීම් නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.1,813,867 ක් වූ ගිණුම් විෂයන් 08 ක් සඳහා ලේඛන හා ලිපිගොනු ආදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී, නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 අනුකූල නොවීම**

**1.3.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 159(1) වගන්තිය | වර්ෂ 02 ත් 06 ත් අතර කාලයක සිට දේපළ 256 කින් අය විය යුතු හිඟ වරිපනම් මුදල රු.732,799 ක් විය. | හිඟ මුදල් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ. 702(03) | කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙනත් චක්‍රලේඛ | | | |
| | ජාතික පරිසර පනතේ නියමයන්ට අදාළව ප්‍රකාශයට පත් කරන ලද 2008 පෙබරවාරි 25 දිනැති සහ 1533/ 16 අංක දරන ගැසට් පත්‍රය | පරිසර බලපත්‍ර 09 ක් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත් හා ගැසට් පත්‍රවල විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.58,435,147 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,546,011 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,618,760 | 11,341,663 | 2,818,155 | 8,523,478 | 11,720,665 | 11,196,749 | 10,959,827 | 4,830,771 |
| (ii) | කුලී | 2,960,200 | 1,269,450 | 1,161,670 | 107,780 | 2,662,600 | 1,180,510 | 1,627,680 | 24,090 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,695,180 | 3,256,622 | 2,963,882 | 292,740 | 2,874,200 | 2,476,666 | 2,482,266 | 18,000 |
| (iv) | වෙනත් ආදායම් | 115,460,920 | 103,465,359 | 103,417,609 | 47,750 | 89,567,810 | 87,844,287 | 53,353,773 | 97,750,424 |
| | එකතුව | 133,735,060 | 119,333,065 | 107,694,317 | 11,638,748 | 106,875,275 | 102,698,213 | 68,423,546 | 102,623,285 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.8,440,434 ක් වූ වරිපනම් බදු අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දි හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කසළ බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.71,000 ක් වූ කසළ බදු ගාස්තු අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දි අය කර ගැනීම සඳහා කටයුතු කරමි. |

**2.2.3** <u>වෙනත් ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ත්‍රීරෝද රථ ගාස්තු අය කිරීම | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.973,850 ක ත්‍රීරෝද රථ ගාස්තු අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දි අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) නළ ළිං ආදායම් | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු හිඟ නළ ළිං ආදායම රු.775,863 ක් වී තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනා ගෙන හිඟ මුදල් ද අය කළ යුතුවේ. | සමීක්ෂණය ආරම්භ කර ඇති අතර, එය අවසන් වූ පසු අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.993,578 ක් හා මුද්දර ගාස්තු රු.95,757,706 ක් විය | ලැබිය යුතු මුදල් ලබා ගත යුතුවේ. | හිඟ මුදල් ඉදිරියේ දි ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**කාර්යසාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | පසු විපරම් ක්‍රියාවලිය සිදු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ලද රු.539,145 ක ත්‍යාග මුදල් උපයෝජනය කර නොතිබුණි. | සභා අරමුණු වෙනුවෙන් මුදල් උපයෝජනය කළ යුතුවේ. | ඉදිරියේ දි මුදල් උපයෝජනය කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තුළ පුරප්පාඩු 16 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගත යුතුවේ. | බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු | | |
| සභා තීරණයකින් තොරව කර්මාන්ත 07 කින් කසළ බදු අය කිරීම නවතා තිබුණි. | ආදායම් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දි සභාවට යොමු කර, තීරණයක් ගැනීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අලදෙණිය ළමා උද්‍යානය සඳහා අය කළ ප්‍රවේශපත් ගාස්තුව 2018 මාර්තු සිට සභා අනුමැතියකින් තොරව නවතා දමා තිබුණි. | ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ජනවාරි මස සිට නැවත අය කිරීම සඳහා කටයුතු කර ඇත. |

**3.5.2 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ඊ-නැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | | |
| සභාවේ ක්‍රියාත්මක වූ ඊ - නැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 2019 ජූලි මස සිට නවතා දමා තිබූ අතර, මධ්‍යස්ථානය සතු පරිගණක යන්ත්‍ර 03 ක් ද අක්‍රීයව පැවතුණි. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | මෙම ව්‍යාපෘතිය යටතේ ලැබෙන සහතිකයේ වලංගු බව හා වෙනත් ආයතන පරිගණක වැඩසටහන් පවත්වන බැවින්, ළමුන්ගේ අඩුවීම මත නවතා දැමීමට සිදු වූ බව දන්වා ඇත. |
| (ආ) ධාවන තත්ත්වයේ පවතින රු.2,938,260 ක වටිනාකමින් යුත් වාහන 04 ක් ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් භාවිතා කිරීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | වෙන්දේසි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් ගනිමි. |

**3.6 <u>ප්‍රසම්පාදනය</u>**

**3.6.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්සය තුළ රු.65,776,895 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ දි නිවැරදි කරමි. |